පොලිස් මාධ්‍ය කොට්ඨාසය
பொலிஸ் ஊடகப் பிரிவு
POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No: 10120
ෆැක්ස් / தொலைநகல / Fax: 011-2171635
දුරකථන / தொலைபேசி / Telephone: 011-2887973 (HUNTING)
වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site: www.Police.lk
ඊ මේල් / மின்னஞ்சல் / E-mail: dir.media@police.gov.lk

මගේ අංකය / எனது இலக்கம் / My NO: 840/2024
ඔබේ අංකය / உமது இலக்கம் / Your No: / 2024
දිනය / திகதி / Date: 18/05/2024 පැය 1850

# මාධ්‍ය නිවේදනය

## “අපරාධ හා ප්‍රචණ්ඩත්වය පිළිබඳ බියකින් තොරව විශ්වාසයෙන් යුතුව ජීවත් වීමට හැකි සාමකාමී පරිසයක් බිහිකිරීම” අරමුණින් මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහනක් - පුත්තලම ප්‍රජා පොලිස් කොට්ඨාසය

අපරාධ හා ප්‍රචණ්ඩත්වය පිළිබඳ බියකින් තොරව විශ්වාසයෙන් යුතුව ජීවත් වීමට හැකි සාමකාමී පරිසරයක් බිහි කිරීම තේමා කර ගනිමින් පුත්තලම කොට්ඨාසයේ මහජනතාව දැනුවත් කිරීමේ විශේෂ වැඩසටහනක් 2024.05.18 වන දින **ගරු මහජන ආරක්ෂක අමාත්‍ය ටිරාන් අලස් මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් හා මහජන ආරක්ෂක අමාත්‍යංශයේ ලේකම් වියානි ගුණතිලක මහතා සහ පොලිස්පති දේශබන්දු තෙන්නකෝන් මහතාගේ සහභාගීත්වයෙන්** පුත්තලම නගර සභා උත්සව ශාලාවේදී පැවැත්විණි.

පුත්තලම පොලිස් කොට්ඨාසයට අයත් ග්‍රාම සේවා වසම් කමිටු 226 ක ප්‍රජා පොලිස් කමිටු සාමාජිකයින් 1200 ක පමණ පිරිසක් මෙම අවස්ථාවට සහභාගී වී ඇති අතර එහිදී ගරු අමාත්‍යතුමා සහ පොලිස්පතිතුමා විසින් එම පිරිස අමතා, පොලිසිය විසින් අපරාධ මැඩලීම සඳහා සිදුකර ගෙන යන වැඩපිළිවෙළට එම කමිටු සාමාජිකයින්ගේ නිරන්තර සහාය අපේක්ෂා කරන බවට ප්‍රකාශ කර ඇත.

මෙම අවස්ථාවට සමගාමීව පුත්තලම කොට්ඨාසයේ පුනරුත්ථාපනය ලැබූ පුද්ගලයින්ගේ පවුල්වල සාමාජිකයින් හට වියළි ආහාර බෙදා දීමක්ද සිදු කර ඇත. තවද ගරු අමාත්‍යතුමා, ලේකම්තුමා සහ පොලිස්පතිතුමා වෙත එම අවස්ථාව සංකේතවත් කරමින් වයඹ පළාත් භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති කිත්සිරි ජයලත් මහතා විසින් සමරු තිළිණ ප්‍රදානය කිරීමක් ද සිදු කර ඇත.

මෙම අවස්ථාවට පුත්තලම දිස්ත්‍රික් ලේකම් එච්.එම්.එස්.පී. හේරත් මහතා, විශේෂ කාර්ය බලකා අණදෙන නිලධාරී ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති වරුණ ජයසුන්දර මහතා, ප්‍රජා පොලිස් සහ පරිසර දිසාව භාර නියෝජ්‍ය පොලිස්පති ජගත් සේරම් මහතා ඇතුළු පිරිසක් සහභාගී විය.

ඡායාරූප




SPECIAL TASK FORCE


පිළිබඳව ප්‍රගතිය ඇතුලත් වාර්තාව
ස්ථිර පදිංචි පුද්ගලයන් සංඛ්‍යාව
හඳුනාගත් තාවකාලික පදිංචිකරුවන් සංඛ්‍යාව
මුළු පුද්ගලයින් සංඛ්‍යාව
ඉන් තොරතුරු රැස් කර ඇති පුද්ගලයින් සංඛ්‍යාව
තවදුරටත් තොරතුරු රැස් කිරීමට ඇති පුද්ගලයන් සංඛ්‍යාව
රාජ්‍ය බුද්ධි සේවාව වෙත යොමුකල සංඛ්‍යාව
444,728
10,874
455,602
247,981
207,621
2758/2023 පරිදි නව ප්‍රජා පොලිස් කමිටු
ප්‍රජා පොලිස් කමිටු ගණන
2023.12.01 දිනට පිහිටුවා ඇති කමිටු ගණන
226






சமூக பொலிஸ் குழுக்களின் உறுப்பினர்கள் மத்தியில் உரையாற்றுவதற்காக புத்தளம் பொலிஸ் பிரிவுக்கு வருகை தந்துள்ள


சமூக பொலிஸ் குழுக்களின் உறுப்பினர்கள் மத்தியில் உரையாற்றுவதற்காக புத்தளம் பொலிஸ் பிரிவுக்கு வருகை தந்துள்ள
பொதுமக்கள் பாதுகாப்பு


உறுப்பினர்கள் மத்தியில் உரையாற்றுவதற்காக புத்தளம் பொலிஸ் பிரிவுக்கு வருகை தந்துள்ள
பொதுமக்கள் பாதுகாப்பு